# ජාතික අධ්‍යාපන ආයතනය

# මහරගම

# පුරප්පාඩු පිරවීම

## ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ සේවා ගණයේ කථිකාචාර්ය/ අධ්‍යාපනඥ - II ශ්‍රේණිය තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ පිළිබඳව වැඩි විස්තර ජාතික අධ්‍යාපන ආයතනයේ **www.nie.ac.lk** වෙබ් අඩවියේ "News & Events" ඔස්සේ බාගත කරගත හැක.

නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඉහත වෙබ් අඩවියේ දක්වා ඇති **https://rp.nie.ac.lk** සබැඳියට (Link) පිවිස මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර යොමු කිරීමෙන් අනතුරුව බාගත කරගනු ලබන අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපත අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය, තැ.පෙ. 21, හයිලෙවල් පාර, මහරගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.02.08 දිනට හෝ මෙම දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස කෙළවර අයදුම් කරන දෙපාර්තමේන්තුව සහ අදාළ විෂය ක්ෂේත්‍රය සඳහන් කළ යුතු වේ.

සැළකිය යුතුයි - රාජ්‍ය සංස්ථා/ මණ්ඩල/ දෙපාර්තමේන්තු/ ව්‍යවස්ථාපිත ආයතන වල සේවය කරන්නන් ඉහත පරිදි මුද්‍රණය කරන ලද අයදුම්පත්‍රය ආයතන ප්‍රධානීගේ නිර්දේශ සහිතව එවිය යුතුය.

**අයදුම්කරුවන් සඳහා කොන්දේසි**

- අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- අයදුම්කරුවන් තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකියාව තිබිය යුතුය. (කෙසේ වෙතත් ඔබගේ නිත්‍ය සේවා ස්ථානය අංක 21, හයිලෙවල් පාර, මහරගම/ හයිලෙවල් පාර, මීපේ වේ.)
- අයදුම්කරුවන් විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත්‍රය සමග උප්පැන්න සහතිකයේ/ අධ්‍යාපන/ වෘත්තීය සහතික සහ සේවා සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පත සමග එවිය යුතුය.
- එක් අයදුම්කරුවෙකුට යොමු කළ හැක්කේ අයදුම්පත්‍ර දෙකක් පමණි.
- මෙය ස්ථිර තනතුරකි. තෝරාගත් අපේක්ෂකයින් තම වැටුපෙන් 8% ක් සේවක අර්ථ සාධක අරමුදල සඳහා දායක විය යුතු අතර, ආයතනය සේවක අර්ථ සාධක අරමුදල සඳහා 12% ක් සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා 3% ක් දායක කරනු ඇත.
- මූලික වැටුපට අමතරව, අනෙකුත් රජයේ අනුමත දීමනා ආයතනය විසින් ගෙවනු ලැබේ. ජාතික අධ්‍යාපන ආයතනයේ අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ. එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව, ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාව විසින් තීරණය කරනු ලබන පරිදි, පත්කිරීමේ බලධාරියා විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන අපේක්ෂකයින්ගේ යෝග්‍යතාව මැන බැලීම සඳහා ලිඛිත තරගකාරී විභාගයක සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පදනම්ව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.
- සෑම අයදුම්කරුවෙකුම රු. 2,000/= ක අයදුම්පත් ගාස්තුවක් ලංකා බැංකුවේ ජාතික අධ්‍යාපන ආයතන ශාඛාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 607626 දරන ගිණුමට බැර කර එම රිසිට්පත ඔබගේ මුද්‍රිත අයදුම්පතට අමුණා එවිය යුතු ය.

රාජ්‍ය සංස්ථා/ මණ්ඩල / දෙපාර්තමේන්තු/ ව්‍යවස්ථාපිත ආයතන රාජ්‍ය සංස්ථාවල සේවය කරන්නෙකු නම් ඉහත පරිදි අදාළ ආයතන ප්‍රධානීගේ නිර්දේශ රහිතව එවන ලද, නියමිත සුදුසුකම් සම්පූර්ණ නොකරන ලද, අසම්පූර්ණ සහ නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉහත ඇබෑර්තු පිරවීමේ අවසන් තීරණය ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාව සතු වේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**